Ministry of Skills Development, Vocational Education, Research and Innovation

# Vocational Training Authority of Sri Lanka

Applications are invited from Sri Lankan citizens who meet the qualified, efficient and excellent character to fill the following vacancies in the permanent service of this Authority.

**01. Assistant Director (Mechanical Engineer)**

**02. Assistant Director (Telecommunication, Electrical, Electronic & Ref and A/C)**

**03. Assistant Director (Textile & Garment)**

**04. Assistant Director (Personal & Community Development)**

**Qulification :-**

1. Having obtain a Degree in Engineering or Bachelor of Science Degree in the relevant field recognized by the University Grants Commission.

   and

   A minimum of one (01) year experience in the relevant field applicable to the post after obtaining the Degree.
2. Having obtained a certificate of proficiency not below the level seventh (07) of the National Vocational Qualification (NVQ-Level 7) issued by Technical/Vocational Training Institute recognized by the Tertiary and Vocational Education Commission.

   and

   At least one (01) year experience in the relevant field in State Institution, State Corporation, Board, Statutory Institution or recognized private sector Establishment after obtaining the above qualifications.

   Or
3. Having obtained a National Diploma in Technology (NDT), National Diploma in Engineering Science (NDES)/Higher National Diploma in Engineering (HNDE) in the relevant field /Diploma in Engineering Technology from the Open University of Sri Lanka/Certificate of National Vocational Qualification-Level 6 (NVQ Level 6) and Six (06) years of experience in the relevant field after having obtained those qualifications.

**Employee Category** : Manager (MM 1-1)

**Salary Scale** : MM 1-1- Rs. 53,175 - 10 x 1375 -15 x 1910 - 95,575/-

**Age Limit** : Age should be not less than 22 years and not more than 45 years.

**Method of Recruitment**

Recruitment shall be made from an open competitive examination as decided by the Board of Directors of the institute and / or a structured interview that is held by the appointing authority.

The above posts are entitled to the Employees Provident Fund and the Employees' Trust Fund.

Eligible applicants should submit their applications by registered post on or before 15$^{th}$ July 2021 to the following address. The post should be sent in the upper left corner of the envelope.

Incomplete, ineligible and late applications will be rejected.

The decision of the Chairman / Board of Directors of the Vocational Training Authority of Sri Lanka is final in recruitment.

Chairman/CEO

Vocational Training Authority of Sri Lanka

"Nipunatha Piyasa" 04th Floor,

No: 354/2, Elvitigala Mawatha, Narahenpita,

Colombo 05.

2021.06.30

***"Skills for Livelihood – Employability for Skills"***

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා**
**නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

**පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.**

**මෙම අධිකාරියේ ස්ථිර සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාල සුදුසුකම් සපුරාලන ලද, කුසලතා පූර්ණ, කාර්යශූර, විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

***01. සහකාර අධ්‍යක්ෂ (යාන්ත්‍රික ඉංජිනේරු)***

***02. සහකාර අධ්‍යක්ෂ (විදුලි සංදේශ / විදුලි / ඉලෙක්ට්‍රෝනික් / ශීතකරණ හා වායුසමීකරණ)***

***03. සහකාර අධ්‍යක්ෂ (රෙදිපිළි හා ඇගළුම්)***

***04. සහකාර අධ්‍යක්ෂ (පුද්ගල හා සමාජ සංවර්ධනය)***

**බඳවා ගැනීමේ සුදුසුකම් :-**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

   හෝ

2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

   හෝ

3. ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (NDT) / ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) / උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (HNDE) / ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා/ ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටම (NVQ Level 6) සහතිකයක් ලබා තිබීම

   සහ

   එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර හයක (06) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සේවා ගණය** :- කලමනාකාර (MM 1-1)
**වැටුප් ක්‍රමය** :- MM 1-1 - රු.53,175 - 10 x 1375 - 15 x 1910 – 95,575/-
**වයස් සීමාව** :- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :-**

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විවෘත ලිඛිත තරඟ විභාගයකින් හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

ඉහත තනතුරු සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

මේ සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් තමන් විසින් සකසන ලද අයදුම්පත් **2021 ජූලි මස 15 දින** හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කල යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ **<u>අයදුම්කරන තනතුර</u>** සඳහන් කර එවිය යුතුය.

අසම්පූර්ණ, අදාල සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එක් තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම් කරන්නේ නම් ඒ ඒ තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කල යුතුය.

බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති/ප්‍රධාන විධායක නිළධාරී,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
"නිපුණතා පියස", 04 වැනි මහළ,
අංක 354/2, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට

2021 ජූනි 30 දින.